# ගීතාවලී

(C) Sumitha Publishers



(C) Sumitha Publishers

2013 දී මහා කවි රබීන්ද්‍රනාත් තාගෝර්තුමාණන්ට
නොබෙල් ත්‍යාගය ලැබී සියවසක් ගතවීම නිමිත්තෙන්
මෙම තෙවන මුද්‍රණය නිකුත් කරන ලදී.

(C) Sumitha Publishers

# පටුන


| | |
|---|---|
| පෙරවදන | 9-12 |
| රබීන්ද්‍රනාත් තාගෝර් : ඔහුගේ ජීවිතය | 13-20 |
| මගේ ජීවිතය | 21-30 |
| ගීතාංජලිය | 31-137 |

# 01

**ඔබ**

අපරිමිත කෙනකු ලෙස
සදා නිම කළහ මා.
එය එබේ සොම්නස යි.
මා දුබල දිවි බඳුන
හිස් කරමින් නැවත නැවත
නව දිවියෙන් පුරවති ඔබ.

(C) Sumitha Publishers

අමරණීය ඔබේ අතැඟිලි
මා හදවත වැදෙනා විට
සතුට ඉල්පා
නිමක් නොමැති වදන් නැගේ.

යුග ගණනින් ගෙවී ගියත්,
යළිදු යළිදු පුරවති ඔබ
ම දිවි බඳුන.
එනමුදු එහි ඇත තව ඉඩ.

මා දිවියෙ වස් දඬුව
හෙල් පතුල් ගිරි මුදුන්
මතින් ගෙන
නවක තනු ගැන්වූහ.

ඉමක් නොමැති ඔබේ පඬුරු
මගේ කුඩා දෑත් මතිනි
මා ලබනුයෙ.



## 02

**ගී** ගයන්නට කියන විට ඔබ
සිත පිරුණු අබිමනින්
නැගෙන කඳුළින් යුතු ව
ඔබ මුහුණ බලමි මම.

සියලු රළු බව මා දිවියෙ ඇති
දිය ව ගොස් ඒ සැණෙහි
ලබයි මුදු සම බවක්.
සයුරු තරණයෙ යෙදෙන
සොම්නසින් පිරි ලිහිණියකු සේ
මගේ හද පිරි බැතිය
විසාපත් විහිදුවයි

දනිමි මම
මගේ ගැයුමෙන් ඔබ තුටු වන බව.
දනිමි මම
ඔබ අබියස මා සිටිනුයෙ
ගායකයකු ලෙස පමණක් බව.

ඈතට ඈතට විහිදීගෙන යන
මගෙ ගීතයෙ අත්තටු කොනගින් මම
කිසි දා මට ළං විය නොහැකි ව ඇති
ඔබේ දෙපා හෙමිහිට පිරිමදිනෙමි.

ගැයුමේ අතුරින් සිහි මුළා වී
මට මා අමතක ව ගොස් ඇත්තෙ
ස්වාමි පුත්‍ර වූ ඔබතුමා හට
'සබඳ' යයි මා අමතා ඇත්තේ.

(C) Sumitha Publishers



# 03

ගායනය ඔබෙ කෙසේ වේ දැයි
නොදන්නෙමි මම මගේ හිමියනි.
විස්මයෙන් ගොළු බව පත් ව සිට
සදා කල්හි ම සවන් දෙන්නෙමි.

ඔබේ සංගීතයේ කැල්මෙන්
එළිය වෙයි මුළු ජගත් දිනිතිය.
ගුවන් තලයෙන් ගුවන් තලයට
විහිද යයි එහි ජීව නාලිය.

මියැසියේ පිවිතුරු නදී දිය
විසල් ගල්පර බිඳ හෙළා ගෙන
බැස ගලා යයි අනන්තයට ම.

(C) Sumitha Publishers

ඔබේ ගීයට එක් ව යෑමට
බලා සිටි හද හඬ නැඟීමට
පලක් නැති වෙහෙසකි දරන්නේ.
ගී ලෙසින් පිට නොවන පද වැල
වියවුලට පත් වී නැඟී යයි.

නිමක් නැති සංගීත ජාලයෙ
මගෙ හදවත හිර කළෝ ඔබ.



# 05



මොහොතකට හෝ ඔබේ සෙවණේ
රැඳී සිටිනට පතමි අවසර.
නිම කරමි වැඩ පසු ව මා සතු.

ඔබේ දසුනෙන් ඈත් වූ විට
නොමැත කිසි සැනසුමක් ම හදට.
නිමක් නැති වෙහෙසකි මගේ වැඩ
තෙරක් නැති කරදර සයුර මැද.

ගිමේ උණුසුම් සුසුම් මිමිනුම්
මගේ කවුළුව වෙත පැමිණ ඇත.
පිපෙන මල් පොකුරු රස් සමග මැද
බමර තියු ගී නැගී විහිදේ.

ඔබේ වත දෙස බලා නිසල ව
ඉතිර යන මේ නිහඬ සැනසුම
ගැලී දිවි පුද කෙරෙන බැති ගී
ගැයීමට දැන් කල් පැමිණ ඇත.

(C) Sumitha Publishers



## 07



විසිතුරු අබරණ ඉවත හෙළා ඇත
මා ගයනා ගීතේ
සුලකළ පැළඳුම් කෙරෙහි ඇගේ සිත
නැත කිසි අබිමානේ.

විසිතුරු පැළඳුම් බාධකයක් වෙයි
ඔබත් මාත් අතරේ
එහි සිලි සිලියෙන් ඔබේ සුමුදු හඬ
යටපත් වනු ඇත්තේ.

කිවියන් අතරෙහි උතුම් කිවිඳුනේ
ඔබේ පා මුල හිඳිමි
ඔබ අබියස මා කිවි අබිමානේ
විලියෙන් මිය යන්නේ.

ඔබගෙන් තනු ගැන්වී ගී නද දෙන
වස් දඬුවක් විලසේ
නොවක් නිසංසල දිවි පෙවෙතක් මට
උරුම කරනු සොඳසේ.

(C) Sumitha Publishers

# 08



කුමර සළු පිළි ගතේ දැවටුණ
රුවන් දම් ගෙල වටා දිදුලන
සිඟිත්තා සිත නොමැත සතුටක්.
ඇඳුම පැටලෙයි පියෙන් පියකම.

දූලි තැවරී කිලිටි වේදැයි
ඉරී යාදැයි සිත තැවෙයි.
ගත සැලීමට බියෙන් මෙන් ඔහු
ඈත්වෙයි මුළු ලෝකයෙන්.

(C) Sumitha Publishers

පොදු මිනිස් බව නමැති උළෙලට
ඇතුළු වීමට ඉඩ නොදේ නම්
දෙරණ රන් රජසින් ඈත් කර
කෙනෙක් ලොව හුදකලා වේ නම්,

මැණියන් ඔබ අනගි බැමි හැම
වාසියක් සේ නොසලකනු මැන.

# 10

දුගී බව ලැබූවන්
පහත් දිවි ගෙවන්නන්
පිළිසරණ නොමැත්තන්
අතර පා රඳවන්න.

හිස නමන්නට වෙර දරමි මම.
මා ප්‍රණාමය ඔබේ පා රැඳී
ගැඹුර වෙත ළං නොවන්නේ ම යි.

දුගී බව ලැබූවන්
පහත් දිවි ගෙවන්නන්
පිළිසරණ නොමැත්තන්
අතර පා රඳනුයෙන්.

(C) Sumitha Publishers

අහිංසකයන් ඇඳුම් ඇඟලා
ඔබ සරන මග වෙතට කිසි දින
උඩඟුකම ළං නොවන්නේ ම යි.

දුගී බව ලැබූවන්
පහත් දිවි ගෙවන්නන්
පිළිසරණ නොමැත්තන්
අතර සැරිසරනුයෙන්.

හුදෙකලා වූවන් අතර හිඳ
ඔවුන් පාළුව දුරු කරන ඔබ
වෙතට එන මං සොයන මා හද
කිසි දිනෙක ළං නොවන්නේ ම යි.

දුගී බව ලැබූවන්
පහත් දිවි ගෙවන්නන්
පිළිසරණ නොමැත්තන්
අතර ඔබ වසනුයෙන්.

